ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## <u>පුවත්පත් නිවේදනය</u>

## <u>ඉන්දියානු නාවික හමුදුවේ "ශර්දු" නෞකාව කොළඹට සේන්දු වේ</u>

ඉන්දියානු නාවික හමුදුවේ ශර්දු නෞකාව 2022 මාර්තු 23 වන දින නවීන සැහැල්ලු හෙලිකොප්ටරයක් ද රැගෙන කොළඹට සේන්දු විය.

2. ගැඹුරු මුහුදු නිරීක්ෂණ නෞකාවක් වන "ශර්දු" නෞකාවේ අණදෙන නිලධාරී කොමාන්ඩර් යතිෂ් බඩෝටියා මහතා බටහිර නාවික ප්‍රදේශය භාර අණදෙන නිලධාරී රියර් අද්මිරාල් ඒ. යූ. සී. ද සිල්වා මහතා හමු විය. ඉන්දියානු රජයේ "අසල්වැසියා ප්‍රථමයෙන්" යන ප්‍රතිපත්තිය අනුව නියෝජ්‍ය ඉන්දීය මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මහතා විසින් ශ්‍රී ලංකා නාවික හමුදුවේ "සාගර" නෞකාව සඳහා අමතර කොටස් ශ්‍රී ලංකා නාවික හමුදුවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී රියර් අද්මිරාල් ඒ. යූ. සී. ද සිල්වා මහතා වෙත භාරදෙන ලදී. මෙම අමතර කොටස් ඉන්දීය රජයේ ප්‍රදනයක් ලෙස 2022 මාර්තු 24 වන දින නෞකාවේ පැවති උත්සවයක දී ශ්‍රී ලංකාවට ලබා දෙන ලදී. නිසි කාලයට අමතර කොටස් ලබාදීම ශ්‍රී ලංකා නාවික හමුද නෞකාවේ ප්‍රශස්ථ මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අවස්ථාව ලබා දෙනු ඇත.

3. එසේම මෙම නෞකාව ශ්‍රී ලංකා නාවික හමුදුව විසින් නිෂ්පාදිත ටොන් 10ක රළ පැදුම් බෝට්ටුවක් සීෂෙල්ස් ආරක්ෂක හමුද වෙත භාරදීමට නියමිතය. ඉන්දියානු නාවික හමුදුවේ මෙම ප්‍රයත්නයන් මිත්‍රශීලී අසල්වාසි රාජ්‍යයන් සමඟ සිය සබ ඳතා ශක්තිමත් කරගැනීම සඳහා "මිත්‍රත්වයේ පාලම්"ගොඩනැගීමේ මූලික සංකල්පය අනුව ක්‍රියාවට නැංවේ.

***

**කොළඹ**
2022 මාර්තු 25